# සභාපතිවරයාගේ පණිවිඩය

**හිතවත් පාර්ශ්වකරුවනි,**

මෙම සමාගමෙහි අධ්‍යක්ෂක මණ්ඩල ප්‍රධානී ලෙසින් ගතවූ වසර සහ ඉදිරි ගමන් මග පිළිබඳව ඔබ වෙත යාවත්කාලීන තතු ගෙන ඒමට ලැබීම මහත් ප්‍රීතියක් මෙන්ම මා ලද භාග්‍යක් ලෙස ද සලකමි. ඓතිහාසිකව ගත් කල මූල්‍යමය වශයෙන් සහ වෙනත් ආකාරයන්ගෙන් අප ළඟා කරගත් දේ පිළිබඳව සාරාංශගත තොරතුරු හා අනාගතයට මුහුණ දීම සඳහා අප මනා ලෙස ස්ථානගතව සිටින අයුරු ඔබ හමුවේ තැබීමේ භාග්‍යය මා නිරන්තරයෙන්ම ලබා ඇත. මූල්‍යමය සාර්ථකත්වය අතින් ගත් කල බදු ගෙවීමට ප්‍රථම ලාභයක් සනිටුහන් නොකරන පසුබිමක මෙම වසරේ මා ගෙනෙන පණිවිඩය තරමක් වෙනස් එකක් විය හැකි නමුදු, අපගේ අනාගත ගමන් මග ඇතුළුව අනෙක් සියලුම අංශවලට අදාළව ඇති ධනාත්මක බව ඒ අයුරින්ම නොවෙනස්ව පවතී.

**බාධක රැසක් සමගින්**

රථවාහන, ඉදිකිරීම්, කෘෂිකර්මාන්ත, බලශක්තිය, ජලය සහ සෞඛ්‍යය යනු අපගේ සමූහයේ අනාගතය රඳා පවතින මූලික ක්ෂේත්‍ර වේ. වෙන් වෙන්ව ගත් කල මේ සෑම ක්ෂේත්‍රයකටම ඊටම අනන්‍ය අභියෝග පවතින අතර ඒවා රටෙහි ක්ෂුද්‍ර-ආර්ථික දර්ශක තුළින් ද ඒ අයුරින්ම විද්‍යාමාන වේ.

රථවාහන ක්ෂේත්‍රයේ අනාගත වර්ධනයක් පිළිබඳව ඉඟි කරමින් වසර අවසානයේ තහනම ඉවත් කළ ද අප පසු කරමින් පැමිණියේ ආනයන තහනම ක්‍රියාත්මකව පැවති නිසා වාහන මෙරටට නොගෙන්වූ තවත් මූල්‍ය වසරකි. යටිතල පහසුකම් හා සබැඳි ආයෝජන බිඳ වැටීම සහ ආර්ථික අර්බුදයේ පසුවිපාක ප්‍රබල ලෙස ඉදිකිරීම්, බලශක්තිය සහ ජලය සම්බන්ධ ව්‍යාපාරවලට බලපාන ලද අතර එමගින් බොහෝ ව්‍යාපෘති ඇණහිටීම හා ඒ ඔස්සේ ව්‍යාපාර අවස්ථා අවම වී ගොස් සම්පූර්ණ කරන ලද වැඩවලට ගෙවීම සඳහා ප්‍රතිපාදන ලබා ගැනීම අසීරු විණි. යටිතල පහසුකම් ක්ෂේත්‍රය යථා තත්ත්වයට පත් වීම තරමක් මන්දගාමීව සිදු වූ අතර එම අංශයේ ව්‍යාපාර සඳහා ඉන් බලපෑමක් ඇති විණි. එමගින් ඉදිකිරීම් යන්ත්‍ර සූත්‍ර, ඉදිකිරීම් කර්මාන්තයේ භාවිත වන වාණිජ බර වාහන සහ ඉදිකිරීම් කර්මාන්තය පෝෂණය කරන අනෙක් ව්‍යාපාරවල භාවිත වන වාහන ආදී සියල්ලට ඇති ඉල්ලුම සීමා කරන ලදී.

කෘෂිකර්ම ක්ෂේත්‍රයේ යෙදවුම් ව්‍යාපාර ද ලාභ නොලැබීමේ ප්‍රධාන සාධකයක් වූ අතර එම ව්‍යාපාර සඳහා වෙළඳපොළෙහි ඇති දැවැන්ත තරඟය නිසා ඇති වූ ලාභ සීමාවේ ක්ෂය වීම මෙයට හේතුව විය. තොග ගොඩ ගැසීම වැළැක්වීම සඳහා භාණ්ඩ අඩු ලාභයකට බෙදා හැරීමට සිදු වූයේ කාලගුණ රටාවේ වෙනස්කම් ද බලපෑම හේතුවෙනි. කෘෂිකර්මාන්තය හා සම්බන්ධ අපනයන සඳහා වන ආයෝජන ද ඇතුළුව කෘෂිකර්ම ක්ෂේත්‍රයෙහි ආයෝජන ද මෙම වසරේ ලාභ නොලැබීමට බලපෑ අතර එම ආයෝජනවලින් උත්පාදනය කරන ලාභය බලාපොරොත්තු වූවාට වඩා පමා වීම එයට හේතුව විය.

සෞඛ්‍ය අංශයෙහි විශාල කොටසක් ජෛව වෛද්‍ය උපකරණ මඟින් උත්පාදනය කරන අතර එම උපකරණ සඳහා ද රාජ්‍ය අංශයෙන් සහ පුද්ගලික අංශයෙන් වන ඉල්ලුමේ දැඩි අඩුවීමක් ද අත් විඳින්නට සිදුවිණි.

**නව ආයෝජන මගින් කාර්ය සාධනයට ඇති කරන බලපෑම**

පසුගිය වසර කිහිපය තුළ, අපි උපායමාර්ගික අත්පත් කර ගැනීම් කෙරෙහි මෙන්ම උපායමාර්ගිකව නව ව්‍යාපාරවලට පිවිසීම් වෙනුවෙන් කටයුතු කළෙමු. මෙම ආයෝජනවලින් බහුතරය කෘෂිකර්ම අංශයට අදාළව යොදවන ලදී.

කෘෂිකර්මාන්තය පදනම් කරගත් ආයෝජන සඳහා ප්‍රවේශ වීමට එක් ප්‍රධාන හේතුවක් වූයේ, එම ක්ෂේත්‍රය තුළ අපගේ ව්‍යාප්තිය පුළුල් කිරීමත් කෘෂිකාර්මික යෙදවුම් හා කෘෂි නිෂ්පාදනවල වටිනාකම් ප්‍රවර්ධනය කිරීමත් වෙනුවෙනි. අපගේ උපායමාර්ගික ප්‍රමුඛතාවයන්ට අනුකූල වෙමින් මෙහිදී අපනයන ක්‍රියාවලිය සඳහා ද අවධානය යොමු විය. කෙසේ වෙතත්, මෙම ආයෝජනවලින් බොහොමයක්, ආදායම් උත්පාදනය කිරීමට බලාපොරොත්තු වූ කාලයට වඩා වැඩි කාලයක් ලබා ගත්තේය. මෙම ප්‍රමාදයන් ද මෙම වසරේ සිදුවූ අලාභයන් කෙරෙහි බලපෑම් ඇති කළේය. නැවුම්

පොල් තෙල්, පොල් කිරි සහ අඟුරු නිෂ්පාදන ව්‍යාපාරයන් කෙරෙහි අහිතකර ලෙස බලපෑ තවත් සාධකයක් වූයේ පොල් මිල ඉහළ යාමයි.

වාණිජ ණය එකතු කිරීම ගැටලුවක්ව පවතින අතර එය ආර්ථික අර්බුදය මගින් ඇතිවූ ප්‍රතිඵලයක් බව පැහැදිලිය. කෙසේ නමුත් වසර අවසාන භාගයේ එහි යම් ප්‍රගතියක් දක්නට ලැබුණි.

**උපාය මාර්ගික දිශානතිය**

විවිධාංගීකරණය, වෙනස්කම් හඳුනාගැනීම සහ සහයෝගීතාවය යන පදනම් ත්‍රිත්වය අපගේ වර්ධන උපායමාර්ගයන් ලෙස නොකඩවා තබාගෙන සිටින්නෙමු. තාක්ෂණය, සේවක මණ්ඩලය සහ තිරසාරත්වය යනු එම උපායමාර්ගයන් යථාර්ථයක් බවට පත් කරන ක්ෂේත්‍ර තුනයි.

**අභ්‍යන්තර පරීක්ෂාව**

විවිධ දුෂ්කරතා මධ්‍යයේ වුවද, අපගේ ප්‍රධාන ව්‍යාපාරික අංශ ධනාත්මක ප්‍රතිඵල ලබා ගැනීමට සමත් ව ඇති නමුත්, කෘෂිකාර්මික අංශයේ සහ තවත් ව්‍යාපාර කිහිපයක සිදු වූ පාඩු හේතුවෙන් එම ධනාත්මක ප්‍රතිඵල සම්පූර්ණයෙන්ම ඵල රහිත බවට පත් විය.

අභියෝගාත්මක කාලවලදී, කෘෂිකාර්මික යෙදවුම් වැනි සාපේක්ෂව නව ව්‍යාපාර මගින් නිපදවන ලද ආදායම් මාර්ග හේතුවෙන්, අප කණ්ඩායමට සාර්ථකව ඉදිරියට ගමන් කිරීමට හැකිව තිබූ නමුත් ඉහතින් සඳහන් කරන ලද කරුණු හේතුවෙන්, 2024/25 මූල්‍ය වර්ෂය සම්බන්ධයෙන් එය ඒ ආකාරයෙන්ම ප්‍රකාශ කළ නොහැකිය. කෙසේ නමුත් අප විසින් ඉදිරිපත් කරන ලද උපායමාර්ගික ප්‍රතිසංස්කරණ සමඟ, කෘෂිකාර්මික යෙදවුම් ව්‍යාපාරය ඉදිරි වර්ෂයේ දී සාර්ථකව ක්‍රියාත්මක වනු ඇතැයි අපේක්ෂා කරන්නෙමු.

දිගු කාලීන වාහන තහනම හේතුවෙන් වාහන ව්‍යාපාරයේ ආයෝජන නැවත සලකා බැලීමට අපට සිදුවූ අතර, සමහර අවස්ථාවලදී රට පුරා පිහිටි පාරිභෝගික සේවා ස්ථාන කිහිපයක් වසා දැමීමට පවා සිදුවිය. වාහන ආනයනයට අවසර ලැබීමත් සමඟ, මෙම අංශයේ අපගේ ව්‍යාප්තිය වැඩි දියුණු කිරීම ගැන අප දැන් සලකා බලමින් සිටින්නෙමු. ට්‍රැක්ටර් සහ අස්වනු නෙළන යන්ත්‍ර මූලික කරගත් කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ ව්‍යාපාර මගින් සතුටුදායක ප්‍රතිඵල ලබා දුන් අතර, අනාගතය සඳහා හොඳ බලාපොරොත්තු සහගත බවක් පෙන්නුම් කළේය. අප වාහන වෙළඳපොලේ සිදුවන වර්ධනයන් පිළිබඳව සමීපව නිරීක්ෂණය කරන අතර, එහිදී ඇතිවිය හැකි අභියෝගවලට මුහුණ දීමට ද සූදානම්ව සිටින්නෙමු.

භූගෝලීය ව්‍යාප්තිය අනුව, බංග්ලාදේශයේ අපගේ ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ ව්‍යාපාරය, වෙළඳපොළ තුළ නිසි තැන ලබා ගනිමින් ස්ථාවරත්වයට පත්ව ඇති බව පැහැදිලිය.

එමෙන්ම, අධ්‍යාපන අංශය තුළ අපගේ අනාගත ව්‍යාප්තිය ද අප විසින් සැලසුම් කර තිබේ. ඩිමෝ තාක්ෂණික අධ්‍යයන ඇකඩමිය (DATS) වැඩි පහසුකම් සහිත සහ වැඩි ධාරිතාවක් සහිත ස්ථානයකට ගෙන යාමත් සමඟම, මෙම ව්‍යාප්තියේ පළමු පියවර ඉක්මනින්ම ක්‍රියාවට නැංවෙනු ඇත.

සෞඛ්‍ය සේවා අංශය පසුගිය වසර කිහිපය තුළ, අත්පත් කර ගැනීම් සහ විවිධාංගීකරණය ඔස්සේ හොඳින් විහිදුණු ආයෝජන සමූහයක් ගොඩනගා ගෙන තිබේ. අලුතින් අත්පත් කරගත් අනුබද්ධිත සමාගම් දෙක හරහා ඖෂධ ව්‍යාපාරය තුළ ආක්‍රමණශීලී මධ්‍යකාලීන වර්ධනයක් අප බලාපොරොත්තු වන්නෙමු.

**තාක්ෂණික පරිවර්තනය**

නවෝත්පාදනය සහ කාර්යක්ෂමතාව පිළිබඳ අපගේ උපායමාර්ගයන්ට අනුව SAP පද්ධතිය ක්‍රියාත්මක කිරීම අපගේ ඩිජිටල් පරිවර්තන ගමනේ වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කළේය. උසස් ව්‍යවසාය සම්පත් සැලසුම්කරණ පද්ධතිය අපගේ මෙහෙයුම් තවදුරටත් විධිමත් කිරීමට උපකාරී විය. සියලුම ව්‍යාපාරික අංශ හරහා කාර්යයන් වඩාත් ඵලදායී ලෙස ඒකාබද්ධ කිරීමට අපට හැකියාව ලැබුණි. SAP හැකියාවන් උකහා ගැනීම තුළින්, දත්ත දෘශ්‍යතාව වැඩි දියුණු කර ගැනීමට, තීරණ ගැනීමේ හැකියාව වැඩි දියුණු කර ගැනීමට මෙන්ම වෙළඳපොළ ගතිකත්වයට කඩිනමින් ප්‍රතිචාර දැක්වීමේ හැකියාව ශක්තිමත් කර ගැනීමට අපට හැකියාව ලැබුණි.

SAP පද්ධතිය භාවිතා කිරීම තුළින්, වේගයෙන් වෙනස් වන ව්‍යාපාරික පරිසරයක පවතින සංකීර්ණතා විශ්වාසයෙන් යුතුව ජය ගැනීමට අපගේ සමාගමට හැකියාව ලැබී ඇත. ප්‍රධාන සාධකයක් ලෙස, මෙය කර්මාන්ත ප්‍රවණතා සමඟ සමපාත වීමට හෝ ඒවාට වඩා ඉදිරියෙන් සිටීමට සහ වෙළඳපොළේ සාර්ථකව තරඟ කිරීමට  ඉඩ සලසනු ලබයි.

මෙම පරිවර්තනය මගින්, තාක්‍ෂණය වර්ධනයේ මූලික අංගයක් ලෙස යොදාගැනීම නම් වූ අපගේ අරමුණ අවධාරණය කරන අතර, අනාගත අභියෝග හමුවේ අනුවර්තනය වීමේ හැකියාව සහ එම අභියෝග දරාගැනීමට අප සතු හැකියාව ද සහතික කරයි.

**අපගේ සේවක මණ්ඩලය**

සාම්ප්‍රදායිකව, DIMO සමාගම සාර්ථකත්වය සඳහා තම සේවකයන් කෙරෙහි බෙහෙවින් විශ්වාසය තැබූ ආයතනයකි. වසර ගණනාවක් පුරා, අප මෙම අපේක්ෂාව සපුරාලීම සඳහා සේවකයින් වෙනුවෙන් ආයෝජනය කර ඇත. සමාලෝචනයට ලක්වන ලද මූල්‍ය වර්ෂය තුළදී, DIMO සමාගම අඛණ්ඩව 13 වැනි වරටත් '' වැඩ කිරීමට විශිෂ්ට ස්ථානයක් '' ලෙස අගය කිරීමට ලක් වූ බව ඔබට සතුටින් දැනුම් දෙමි.

**තිරසාරත්වය**

තිරසාරත්වය නූතන ව්‍යාපාරික සාර්ථකත්වයේ මූලික පදනමක් ලෙස මතුව ඇති අතර, සමාගම් ක්‍රියාත්මක වන, නවෝත්පාදනය කරන, සහ වර්ධනය වන ආකාරය එමගින් හැඩගස්වා ඇත. DIMO සමාගම වෙනුවෙන් තිරසාරත්වය සඳහා වූ කැපවීම සදාචාරාත්මක අවශ්‍යතාවයක් පමණක් නොව, උපායමාර්ගික අවශ්‍යතාවයක් ද වන බව අප පිළිගන්නෙමු.

අපගේ මෙහෙයුම්වල සෑම අංශයකටම තිරසාර භාවිතයන් මූලික කර ගැනීම හේතුවෙන්, අපගේ කොටස් හිමියන් සඳහා දිගුකාලීන වටිනාකමක් සුරක්ෂිත කිරීමට පියවර ගෙන ඇත්තෙමු. . ආර්ථික ශක්‍යතාව පිළිබඳ මෙම අවධානය, වෙනස් වන වෙළඳපොළ ගතිකත්වයන් සහ නියාමන රාමු හමුවේ සිදුවන වෙනස්කම් පවා දරාගනිමින් පවත්වා ගැනීමට අපට ඉඩ සලසයි.

අපගේ "තිරසාරත්ව න්‍යායපත්‍රය" මගින් වෙනසක් සඳහා වූ මං සැලසුම ඉදිරිපත් කරමින් මෙම කැපවීම වඩා හොඳින් පැහැදිලි කළ හැකිය. කාබන් බලපෑම අඩු කිරීම, සම්පත් කාර්යක්ෂමතාව ඉහළ නැංවීම, සහ අපගේ විවිධ ව්‍යාපාරික අංශ වෙත අන්තර්ග්‍රහණය වීම දියුණු කිරීම වැනි ඉලක්ක මෙම න්‍යාය පත්‍රයට ඇතුළත් වේ.

පුනර්ජනනීය බලශක්තිය, පරිසර හිතකාමී තාක්ෂණයන් භාවිතය, සහ උපායමාර්ගික හවුල්කාරිත්වයන් තුළින් ක්‍රියාත්මක වන ඉලක්කගත මූලපිරීම් හරහා, අපගේ වර්ධන ගමන් මග තිරසාරත්වයේ මූලධර්ම සමඟ සමපාත කිරීමට අප අපේක්ෂා කරන්නෙමු. නවෝත්පාදනය සහ සහයෝගීතාවය කෙරෙහි අවධානය යොමු කිරීමෙන්, මෙම න්‍යායපත්‍රය ගෝලීය හොඳම භාවිතයන් සහ ප්‍රමිතීන්ට අනුකූලවීම සහතික කරනවා පමණක් නොව, වගකිවයුතු ව්‍යාපාරික භාවිතයන්හි පුරෝගාමියෙකු ලෙස DIMO සමාගම ස්ථානගත කිරීම ද සිදුවේ.

එසේ කිරීමෙන්, එය ලාභදායිත්වය සහ අරමුණ සමතුලිත කිරීමට අපට බලය ලබා දෙන අතර, ස්ථිරසාර ප්‍රගතියක උරුමයක් නිර්මාණය කරයි.

**ඉදිරි දැක්ම**

පෙනෙන ආකාරයට, සමාගම මුහුණ දුන් අභියෝග සහ බාධක ජයගෙන ඉදිරි වසරේදී ලාභදායීත්වය සහ වර්ධනය කරා ගමන් කිරීමට අපට හැකිවනු ඇත. වාහන වෙළඳපොළ විවෘත කිරීම අපගේ ආදායම සැලකිය යුතු ලෙස වර්ධනය කිරීමට මූලික වනු ඇතැයි  අපේක්ෂා කරන්නෙමු. යටිතල පහසුකම් ව්‍යාපෘති නැවත ආරම්භ කිරීම සහ විදුලි හා ජල සම්බන්ධ ව්‍යාපෘති ආරම්භවීමට අවකාශ විවර වීමෙන් ආදායම තවදුරටත් ඉහළ නංවනු ඇතැයි බලාපොරොත්තු වන්නෙමු. උපායමාර්ගික වෙනස්කම් මත කෘෂිකාර්මික අංශය නැවත ලාභදායීත්වයට පත්වීමෙන් ධනාත්මකව දායක වනු ඇතැයි යන අපේක්ෂාව ද අප සතුව ඇත. ව්‍යාපාර සැලසුම් මගින් මූල්‍ය කාර්යසාධනයේ හැරවුම් ලක්ෂ්‍යයක් පෙන්නුම් කරන අතර, එය සතුටුදායක ප්‍රතිලාභ ලබා දෙනු ඇත.

ඉදිරියට යන විට, අපි අපගේ මූලික උපායමාර්ගය කෙරෙහි අවධානය යොමු කරමින් සිටින අතර, අපගේ ආයෝජන සමූහය හරහා වර්ධනය මෙහෙයවීමට කැපවී සිටින්නෙමු. විවිධාංගීකරණය, වෙනස්කම් හඳුනාගැනීම සහ සහයෝගීතාවය සඳහා අප දරන ප්‍රයත්නයන් අපගේ ප්‍රවේශයේ මූලික පදනම ලෙස දිගුකාලීනවම පවතිනු ඇත. අපි අනාගතය පිළිබඳව සුබවාදී වන අතර, අභියෝග ජය ගැනීමට සහ අවස්ථා උදා කර ගැනීමට අප සතුව ඇති හැකියාව පිළිබඳව විශ්වාසයෙන් සිටින්නෙමු.

**ප්‍රතිලාභ**

2024/25 මූල්‍ය වර්ෂය සඳහා සමාගම ලත් ප්‍රතිඵල, ලාභාංශයක් ප්‍රකාශයට පත් කිරීමට තරම් ප්‍රමාණවත් නොවේ. කෙසේ වෙතත්, බාහිර සාධකවල හිතකර වෙනස්කම් සහ කෘෂිකර්මාන්තය වැනි ඇතැම් අංශවල උපායමාර්ගික වෙනස්කම් අපේක්ෂා කිරීමත් සමඟ, 2025/26 මූල්‍ය වර්ෂය සඳහා සතුටුදායක ප්‍රතිඵල ලබා දීමට සමාගම සූදානමින් සිටියි.

**ඇගයීම**

DIMO සමාගමට ශ්‍රී ලංකාව තුළදී නවීනතම විසඳුම් ලබාදීමේ කාර්යයේදී හොඳම මට්ටමේ ප්‍රධාන සමාගම් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට ලැබීම වරප්‍රසාදයක් සේ සලකන්නෙමි. ඔවුන් DIMO සමස්ත පද්ධතියේ වැදගත් කොටසක් වන අතර, DIMO ප්‍රගමනය සඳහා අතිශය වැදගත් කාර්යභාරයක් ද ඉටුකොට ඇත. DIMO අද පවතින තත්වයට පත් කිරීමට ඔවුන්ගෙන් සිදුවූ බලපෑම මා බෙහෙවින් අගය කරන අතර, වසර ගණනාවක් පුරා DIMO සාර්ථකත්වයට දායක වූ සෑම විදේශීය ප්‍රධාන සමාගමකටම ස්තූතිය පුදකර සිටිමි.

මගේ කළමනාකාරීත්ව කණ්ඩායම විසින් මෙහෙයවනු ලබන අපගේ සාමාජිකයන්, අභියෝගයන්ට දූරදර්ශීව හා අධිෂ්ඨානයෙන් මුහුණ දීම සඳහා ඉතා සමීප කණ්ඩායමක් ලෙස කටයුතු කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය, සෑම මොහොතකම මා ශක්තිමත් කළ අතර, මෙම දුෂ්කර කාල පරිච්ඡේදය සාර්ථකව ජය ගැනීමට ඔවුන්ගේ වටිනා උපදෙස් ලබා දුන්නේය. ඔවුන් සියලු දෙනාටම මගේ හෘදයංගම ස්තූතිය පිරිනමමි.

මෙයට විශ්වාසී
රංජිත් පණ්ඩිතගේ
සභාපති

2025 ජූනි 5, කොළඹ